*සැ. යු.-* 2020.09.18 දින පළ වූ අංක 2,193/56 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* අවලංගු කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,195 - 2020 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2020.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |

| | පිටුව |
|---|---|
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 600 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 601 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ඔක්තෝබර් මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ඔක්තෝබර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

599- B 082061 — 353 (2020/09)
D 1 -

# පිස්කල් විකිණීම්

## මහනුවර දිසා අධිකරණයේ දී ය

### විකිණීමේ දැන්වීම

මහනුවර කටුගස්තොට පාර, අංක 187 හි ප්‍රධාන කාර්යාලය පිහිටි සෙරෙන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්,

නඩු අංකය :- DMB 00034/17
ඇස්කීසි අංකය :-

..............*පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

සරත් උපාලි ප්‍රේමරත්න,
අංක 409, විලියම් ගොපල්ලව මාවත, මහනුවර.

........................*විත්තිකරු.*

01) රෙජිස්ට්‍රාර්, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, මහනුවර
02) විත්තිකරුට

වර්ෂ 2019 ක් වූ ජුනි මස 17 වැනි දින දරන මහනුවර දිසා අධිකරණ නඩු තීන්දුව ප්‍රකාර එකී නඩුවේ ඉහත කී විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගමට අයවීමට ඇති රුපියල් හැටතුන් ලක්ෂ තිස්පන්දහස (රු. 6,335,000.00) ක මුදලක් සහ පැමිණිල්ලේ ආයාචනයේ ආ, ඇ, ඈ, ඉ, ඊ, හා උ ජේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා ආඥාකොට ඇති බැවින් ද,

ඉහත කී රුපියල් හැටතුන් ලක්ෂ තිස්පන්දහස (රුඃ 6,335,000.00) ක මුදල සහ පැමිණිල්ලේ ආයාචනයේ ආ, ඇ, ඈ, ඉ, ඊ හා උ ජේදයන්හි සහනයන් ද ලබාගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළට අයත් සියලුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුළුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි පහත උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයෙහි සඳහන් දේපලෙන් උපදන සහ එකතුවන සියලු කුලී ලාභ සහ අනෙකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපළ නිශ්චිතව බැඳී ඇති බවට හා ඇස්කීසි කළහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින්ද අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ,

වර්ෂ 2020 ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින ප. ව 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගඟපළාත උඩරියගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඊරියගම පිහිටි 'පෙතිගේහින්න' නමැති ඉඩමට පී. ඉන්ද්‍රාණි මල්ලිකා අවසරලත් මිනින්දෝරු මහත්මිය විසින් වර්ෂ 2011ක් වූ ජූලි මස 22 වැනි දින මැන සාදන ලද අංක 678 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 02 දරන කොටසට මායිම් උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 01 ද, නැගෙනහිරට : පොල්ගහමුල සිට මුරුතලාව දක්වා දිවෙන පාර ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : පන්සලට අයත් ඉඩමේ පැළ ඉනි වැට ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහ (අක්. 0, රූඩ්. 0, පර්. 12) ක් විශාල ඉඩම සහ ඊට අයත් ගහකොළ පලතුරු ආදි සියලු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක B 598/131 හි ලියාපංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මහනුවර.

වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 25 වැනි දින දී ය.

09-502

# විවිධ දැන්වීම්

## (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

පොල්ගස්ඕවිට, හල්පිට, හොරණ පාර, අංක 173/1/2 හි ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන මැජ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

නඩු අංකය :- HC/Civil/29/2020/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

2007 අංක 7 දරන සමාගම් පනතේ XII වන කොටස යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක කාරණයේ දී ය.

මැජ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 173/1/2, හොරණ පාර,
හල්පිට,
පොල්ගස්ඕවිට.

......................*පෙත්සම්කරු.*

කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් මැජ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් පොල්ගස්ඕවිට, හල්පිට, හොරණ පාර, අංක 173/1/2 දරන ස්ථානයේ පිහිටි මැජ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 21 වැනි දින ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 07 වැනි දින මහාධිකරණය ඉදිරියේ ඇසීම සඳහා නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධයෙන් සහය දැක්වීමට හෝ ඊට විරුද්ධ වීමට අපේක්ෂා කරන එකී සමාගමේ යම් ණය හිමියෙකු හෝ දායකයෙකු නඩුව අසනු ලබන අවස්ථාවේදී එම කාර්ය සඳහා තම නීතිඥවරයා මගින් පෙනී සිටිය හැකි බවත්, අවශ්‍ය කරන එකී සමාගමේ ණය හිමියකුට හෝ දායකයකුට ඒ සඳහා වූ නියමිත ගාස්තු ගෙවූ පසු පහත අත්සන් කළ අය විසින් පෙත්සමේ පිටපතක් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ.-

සුදත් පෙරේරා ඇසෝසියේට්ස්,
අංක 05, 09 වන පටුමග,
නාවල පාර,
නාවල.

**සටහන.-**

එකී පෙත්සම අසනු ලබන අවස්ථාවේදී පෙනී සිටීම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් එසේ කිරීමට ඇති තම අපේක්ෂාව දන්වීම ලිඛිතව ඉහත නම් සඳහන් සුදත් පෙරේරා ඇසෝසියේට්ස් වෙත භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. දැන්වීමේ පුද්ගලයාගේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු ය. *නැතහොත්* සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය ප්‍රකාශ කළ යුතු අතර, එයට එම තැනැත්තකු විසින් හෝ සමාගම විසින් *නැතහොත්* (සිටිනම්) ඔහුගේ හෝ ඇයගේ නීතිඥවරයෙකු විසින් අත්සන් කළ යුතු අතර, එය වර්ෂ 2021ක් වූ ජනවාරි මස 06 වැනි දින පස්වරු 6.00ට පෙර ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ භාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවනු ලබන්නේ නම්, ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඇතිව තැපෑලෙන් එවිය යුතුය.

සුදත් පෙරේරා ඇසෝසියේට්ස්,
අංක 05, 09 වන පටුමග,
නාවල පාර,
නාවල.

09-646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.